**නිහාල් ශ්‍රී අමරසේකර** වරලත් ගණකාධිකාරී, වරලත් කළමණාකරණ ගණකාධිකාරී
ව්‍යාපාර සහ කළමණාකරණ උපදේශක

2004 අප්‍රේල් 6

අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග
ශ්‍රී ලංකා ජනාධිපතිනිය
ජනාධිපති මන්දිරය
ජනාධිපති මාවත
කොළඹ 1.

අතිගරු උත්තමාවියනි

රජයට අතිවිශාල පාඩු සිදුකරමින් මහජන මුදල් අයථා ලෙස
පරිහරණය කිරීම සහ මහජන ආදයම් වංචා කිරීම

රටෙහි ආදයමට මහජන මුදල් වලට සහ පිස්කල් පාලනයට කේන්ද්‍රීය වන රජය වෙනුවෙන් මහජනයාගෙන් එකතු කරනු ලබන මහජන මුදල් අයුතු ලෙස පරිහරණය කිරීම එකී නීතිය මගින් කමා කර ඇතිබව සහ නීතිය කඩකලවුන්ට සමාවන් ප්‍රදනය කිරීමක් කරනු ලැබ ඇති බවත් එමගින් රජයට ඉමහත් පාඩු සිදුකරමින් මහජන මුදල් වංචා කර ඇති බව ශ්‍රේෂ්ඨාධිකරණයේ පංච පුද්ගල විනිසුරු මඩුල්ල විසින් බදු සමා පනත ගැන 2004 මාර්තු 26 දින දෙනු ලැබ ඇති ඒකමතික අධිකරණ මතයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබ ඇත. එහි ප්‍රතිලාභයන් ඔවුනට අහිමි කළ නොහැකි මහජන අදයම් ඔවුන් වෙනුවෙන් භාරකාරත්වයේ දරනු ලබන බව සිහිතබාගත යුතුයැයි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිගමනය කර ඇත.

එම මත ප්‍රකාශය කරනු ලැබ ඇත්තේ එහි දක්වා ඇති ප්‍රකාර ඔබ තුමිය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමුකර ඇති ප්‍රශ්ණයන් මතය. එනම් (ඇ) නීතියේ ආධිපත්‍යය කඩතොලු කිරීමක ප්‍රතිඵලයක් ගෙන දෙන මහජනයාගේ ප්‍රතිලාභය සඳහා භාරකරත්වයේ රදවා ඇති මහජන මුදල් අයුතු ලෙස පරිහරණය කිරීමක් සිදුවී තිබේද ? මහජන වැදගත්කමක් ඇති කාරණයක් සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත අයිතිය ක්‍රියාත්මක කරමින් එම ප්‍රශ්න ඔබ තුමිය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කර ඇත.

මානව හිමිකම් සහ සිවිල් සහ දේශපාලනමය අයිතිවාසිකම් පිළිබද ප්‍රඥප්තියේ විශ්ව ප්‍රකාශයේද අඩංගුවී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති සමානාත්මකතාවය එකී නීතිය මගින් උල්ලංඝනය කර ඇති බව සහ අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යටිතල පදනම වන නීතියේ ආධිපත්‍යයට එම නීතිය ප්‍රතිවිරුද්ධ බවත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිගමනය කරනු ලැබ ඇත.

නීති නියමයන් අනුව, රජයට පාඩු සිදුකිරීම සහ අන් අයට හෝ තමා වෙත ප්‍රතිලාභ පිරිනැමීම දූෂණය වන්නේය. "පවරනු ලැබ ඇති යම් නීති කෘතියක්" අතරතුර ක්‍රියාත්මක කිරීම සඳහා අල්ලස් සහ දූෂණ පිළිබද චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවට ඇති අයිතිය හැරුනු විට, ප්‍රසිද්ධ එළිදරව් කිරීමේ න්‍යායන්ට පටහැනිව, එම නීතිය මගින් පූර්ණ රහස්‍යභාවකට ඉඩකඩ සලසා ඇති අතර, නීති කෘතියක් පැවරීම සඳහාම විමර්ශන පැවැත්වීමට තොරතුරු අවශ්‍ය වේ. ඒ අනුව දූෂණය පිළිබදව ජාත්‍යන්තර සම්මුතියට පටහැනිව අල්ලස් සහ දූෂණ පිළිබදව බලාත්මක සෝදිසියක් කිරීම නතු කර නොමැත්තේද ?

කැබිනට් මණ්ඩලය රැස්වීම්වලදී ඔබ තුමිය නොසිටියද, එම නීතිය අශික්ෂිත ලෙස කඩිමුඩියේ යවා ඇතිබව පෙන්වා දෙමින් එම නීතියේ අකටයුතු අංගයන් ගෙන හැර දක්වමින් 2003 ජුලි මස 10 දින හෝ එදිනට ආසන්නයේ ඔබ තුමිය විසින් කලින් අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ කැබිනට් අමාත්‍ය මණ්ඩලය වෙත සටහනක් යවා ඇත. වෙනත් දේ අතර ත්‍රස්තවාදී අරමුදල් හෝ ත්‍රස්තවාදී ක්‍රියාවන්ට අදල අරමුදල් තහනම් කර රාජසන්තක කර ගැනීමට සහ කලු සල්ලි සුදු කිරීම සහ සාපරාධී වරදවල් පිළිබද ප්‍රශ්න පිළිබදව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ අංක 1373 දරණ සම්මතය සහ එයට අදලව 1968 අංක 45 දරණ එක්සත් ජාතීන්ගේ පනත යටතේ 2001 ඔක්තෝබර් 16 දින ගැසට් කළ රෙගුලාසි අභිමුඛයේ ශ්‍රී ලංකාවේ බැදීම කෙරෙහි ඔබ තුමිය විසින් එමගින් අවධානය යොමු කරවා ඇත.

167/4 ශ්‍රී විපුලසේන මාවත, තැ. පෙ. 1796, කොළඹ 10, ශ්‍රී ලංකාව
දුරකථන 2696814, 2686364, 4715988 ෆැක්ස්: 2697134 (මහනුවර දුරකථන/ ෆැක්ස්: 4470442)
ඊ මේල් nihalsri@slt.lk, comindtax@lanka.ccom.lk

එකී නීතිය රටෙහි අර්ථිකයට හානිකර බවත් එමගින් රටවැසියා දිළිදුතාවයට පත්කරනු ඇතිබවත් ස්වභාවික යුක්ති ධර්මතාවයන්ට එය පටහැනි වන බවත් ඔබ තුමිය විසින් පෙන්වා දෙමින් එම නීතිය ක්‍රියාත්මක කිරීම වහාම අත්හිටුවන ලෙසත් අවශ්‍ය කර ඇත.

පූර්වෝක්ත කාරණයන් සැහැල්ලුවට ගනිමින් යථා තත්වය පිළිබඳව ඔවුන් දැනුවත්කර තිබියදීත් එම නීතිය අවලංගු කිරීම කෙසේ වෙතත් රජයට තවදුරටත් පාඩු සිදුකරමින් තව තවත් අයවළුන්ට මහජන මුදල් අයතු ලෙස පරිහරණය කිරීමට සහ මහජන මුදල් වංචා කිරීමට මග පහදමින් කලින් අගමැති රනිල් වික්‍රමසිංහ සහ කලින් මුදල් ඇමති කේ. එන්. චොක්සි විසින් එම නීතියේ වලංගු කාලය දීර්ඝ කර සිටින ලදී. 2003 මාර්තු 26 දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද අධිකරණ මතය අභියස සාමුහිකව ක්‍රියා කරනු ලැබ ඇති කලින් කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරුන්ද ඇතුළුව ඔවුන් දෙදෙනා රජයට ඉමහත් පාඩු සිදුකරමින් මහජන මුදල් වංචා කිරීම අභිමුඛයෙහි වගඋත්තර දිය යුතු ලෙසට නිගමනය කළ යුතු නොවන්නේද ?

රටෙහි ආදයමට පොදු අරමුදල්වලට සහ පිස්කල් පාලනයට කෙන්ද්‍රිය වන රජයට සිදුකරන ලද පාඩුව රු. බිලියන 200 ක් ලෙස ඇස්තමේන්තුකර අධිකරණය අභියස තබා ඇති අතර එම ඇස්තමේන්තුව ප්‍රතික්ෂේපකර සිටීමක් හො නිවැරදි ගණනයක් අධිකරණය හෝ මහජනයා වෙත ඉදිරිපත් කර සිටීමක් කර නොමැත.

එම නීතිය පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කර සිටි අවසිථාවේදී මහජන මුදල් වලට සිදුවන පාඩුවේ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර නොමැත. අයකර ගත නොහැකි මහජන මුදල් කපා හැරිය බවට කරන ලද බොළඳ ප්‍රකාශය ආදයම් එකතු කරන බලධාරීන් හෝ විගණකාධිපති විසින් සහතික කර නොමැත. අයකර ගන්නා ලද රාජ්‍ය මුදල් පවා ආපසු ගෙවා ඇතිබව සෝදිසි කර බැලීමෙන් අනාවරණයවේ.

2003 දක්වා වසර 5 ට මධ්‍යක වාර්ෂික ණය ගැනීම රු. බිලියන 187 ක්වු අතර රටෙහි ණය මට්ටම රු. බිලියන 184 කින් 2003 වසරේදී වැඩිවී ඇති බවත් 2004 සඳහා රු. බිලියන 350 ක ණය ගැනීමක් අයවැය ගතකර ඇතිබවත් ඔබතුමිය විසින් අවධානයට ලක් කරනු ලැබ ඇත.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මෑතකදී දිනපතාම බීබීසිය විසින් වාර්තා කර සිටි අතර කලින් අග්‍රමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාටත් කැබිනට් මණ්ඩල ඇමතිවරුන්ටත් අධි චෝදනා පත්‍රයක් වන යථෝක්ත ඒකමතික අධිකරණ මතය සම්පූර්ණයෙන්ම කළු පටලයකින් වසා දැමුවා සේම (වසරක 4ක් ඔස්සේ රු. බිලියන 450 ක ණය ගැනීමක් ටෝකියෝහිදී පොරොන්දු වෙමින්) ශ්‍රී ලංකාවේ සංවර්ධනයට සහ සාම ක්‍රියාදමයට මැදිහත්ව සිටින ජාත්‍යන්තර ප්‍රජාව සහ ඒජන්සි ආයතන විසින් පූර්වෝක්ත කාරණයන් කමාකර තහවුරු කර සිටින්නේ කෙසේද යන්න අදහාගත නොහැකිය.

මෙයට ගෞරවපූර්වක

නිහාල් ශ්‍රී අමරසේකර

ශ්‍රී ලංකාවේ අගමැති ගරු. මහින්ද රාජපක්ෂ

පිටපත: ටෝකියෝ සම්මෙලනයේ ජාත්‍යන්තර රටවල්හි / ඒජන්සි නියෝජිතයින්

ඔහලීම: ශ්‍රේෂ්ඨාධිකරණ මතය